### 7 වැනි වගන්තිය යටතේ වූ දැන්වීමයි

පොදු කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දැක්වෙන ඉඩම ලබාගැනීමට ආණ්ඩුව අදහස්කරන බැවි 1954 රේ අංක 39 දරණ ඉඩම් රජය සන්තක කිරීමේ (සංශෝධිත) ආඥපනතින් සංශෝධිතවූ,

1950ගේ අංක 9 දරණ ඉඩම් ලබාගැනීමේ ආඥාපනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

පොදු කටයුත්ත: ගා/කුරුඳුවත්ත යෝතක පාසල සඳහා රජයට ඉඩම් අත්පත් කර ගැනීම.

කෘෂිකර්ම හා ඉඩම් පිළිබඳ ගරු ඇමතිතුමා විසින් ඔහුගේ 59.9.7 වැනි දින අංක ජේ. 58/59 ඊ. 187 දරණ ප්‍රකාශනයෙන් තීරණය කර, 59.10.9 වැනි දින අංක 11,891 දරණ රජයේ ගැසට් පත්‍රයෙහි පළ කරන ලද පරිදි,

ලබාගැනීමට බලාපොරොත්තු වන ඉඩම්වල විස්තර:—

ප්‍රාදේශීය ආදායම් නිලධාරි කොට්ඨාශය: කඩවත් සතර; ගම්මුලාදෑනි වසම: කුරුඳුවත්ත; ගම: කුරුඳුවත්ත; සැලැස්මේ අංකය: ඒ.1782 දරණ මූලික සැලැස්ම

කැබලි අංක: 2

ඉඩමේ නම: ජම්බුගහ වත්ත; විස්තර: පොල්ගස් 2 ක්, දෙල් ගසක් සහ බදාමෙන් බඳිනලද ගොඩනැගිල්ලක් ඇතුලත් වත්ත; ප්‍රමාණය: අ. 0, රූ. 1, ප. 38.8.

කැබලි අංක: 2

ඉඩමේ නම: කැඹිලිගහ වත්ත; විස්තර: දොඹගස් 4 ක්, කොස් ගසක්, ගොරක ගසක් සහ පොල් ගසක් ඇතුලත් වත්ත; ප්‍රමාණය: අ. 0, රූ. 3, ප. 27.9.

කැබලි අංක: 3

ඉඩමේ නම: මරදානකුරුඳුවත්ත; විස්තර: පොල්ගස් 53 ක්, දොඹගස් 3 ක් සහ තාවකාලික ගොඩනැගිල්ලක් ඇතුලත් වත්ත; ප්‍රමාණය: අ. 1, රූ. 1, ප. 05.1.

ඉහත සඳහන් ඉඩම්වලට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලුදෙනාම තම තමන් හෝ ඔවුන්ගෙන් ලියවිලිවලින් බලය ලත් අයවලුන් 1960 සැප්තැම්බර් මස 27 වැනි දින පූ. භා. 9ට ගාල්ලේ දිසාපති කාර්යාලයේදී මා සම්මුඛ විය යුතුයි.

තවද 1960 සැප්තැම්බර් මස 20 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම් සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල සවභාවයත්, එකී ඉඩම් ලබාගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත් වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත් මා වෙත පිටපත් දෙකක් සහිතවූ ලියවිල්ලකින් දැනුම්දිය යුතුයි.

අයිතිවාසිකම් සථිර කිරීමට අදාලවන ඔප්පු, ලියකියවිලි ආදිය විභාගය පවත්වන වේලාවේදී මාවෙත ඉදිරිපත් කළ යුතුය.

අංක ඒ. 1782 දරණ සැලැස්මේ පිටපතක් බැලීම සඳහා කුරුඳුවත්ත ගම්මුලාදෑනි තැනගේ කාර්යාලයේ තැන්පත් කර ඇත.

නෙවිල් ඩේවිඩ් ජයවීර,
ආණ්ඩුවේ උප ඒජන්ත තැන,
ගාලු දිස්ත්‍රික්කය.

1960 අගෝස්තු 12 වැනි දින,
ගාළු කච්චේරිය.

---

නො. ඇල්. ඒ. ඒ. 130.

## 1954 රේ අඩක 39 දරණ ඉඩම් රජය සන්තක කිරීමේ (සංශෝධිත) ආඥාපණතින් සංශෝධිත වූ 1950 ගේ අඩක 9 දරණ ඉඩම් ලබාගැනීමේ ආඥාපණත

### 7 වැනි වගන්තිය යටතේ වූ දැන්වීමයි

පොදු කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දක්වෙන ඉඩම ලබාගැනීමට ආණ්ඩුව අදහස්කරන බැව් 1954 රේ අංක 39 දරණ ඉඩම් රජය සන්තක කිරීමේ (සංශෝධිත) ආඥාපණතින් සංශෝධිත වූ, 1950 ගේ අඩක 9 දරණ ඉඩම් ලබාගැනීමේ ආඥාපණතේ 7 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

පොදු කටයුත්ත: ගා/ඇල්පිටිය රජයේ මිශ්‍ර පාසැල සඳහා රජයට ඉඩම් අත්පත් කරගැනීම.

කෘෂිකර්ම හා ඉඩම් පිළිබඳ ගරු ඇමතිතුමා විසින් ඔහුගේ 59.10.6 දින අංක ජේ. 57/58 ඊ. 743 දරණ ප්‍රකාශනයෙන් තීරණය කර 59.11.20 වැනි දින අංක 11,959 දරණ රජයේ ගැසට් පත්‍රයෙහි පළ කරන පරිදි,

ලබාගැනීමට බලාපොරොත්තු වන ඉඩම්වල විස්තර:—

ප්‍රාදේශීය ආදායම් නිලධාරි කොට්ඨාශය: බෙන්තර වලල්ලාවිටි කෝරලය; ගම්මුලාදෑනි වසම, ඇල්පිටිය; ගම: ඇල්පිටිය; සැලැස්මේ අංකය: ඒ. 1793 දරණ මූලික සැලැස්ම.

කැබලි අංකය: 1

ඉඩමේ නම: මුල්ලගෙ වත්ත; විස්තර: දොඹගස් එකක් සහ රබර්ගස් එකක් ඇතුලත් වත්ත; ප්‍රමාණය: අ. 0, රූ. 0, ප. 33.6.

කැබලි අංක: 2

ඉඩමේ නම: මුල්ලගෙ වත්ත; විස්තර: එලවළු සහ ඉදල්ගස් 2 ක් ඇතුලත් වත්ත; ප්‍රමාණය: අ. 0, රූ. 0, ප. 10.0.

කැබලි අංක: 3

ඉඩමේ නම: කුරුඳුවත්ත කැලෑව; විස්තර: කොස්ගස් එකක්, වල් දෙල්ගස් දෙකක් සහ රබර්ගස් 153 ක් ඇතුලත් ඉඩම; ප්‍රමාණය: අ. 0, රූ. 3, ප. 32.0.

ඉහත සඳහන් ඉඩම්වලට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලුදෙනාම තම තමන් හෝ ඔවුන්ගෙන් ලියවිලිවලින් බලය ලත් අයවලුන් හෝ 1960 සැප්තැම්බර් මස 28 වැනි දින පූ. භා. 10.30 ට ගා/ඇල්පිටිය සිංහල මිශ්‍ර පාඨශාලාවේ දී මා සම්මුඛ විය යුතුයි.

තවද 1960 සැප්තැම්බර් මස 21 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම් සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල සවභාවයත්, එකී ඉඩම් ලබාගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත් වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත් මා වෙත පිටපත් දෙකක් සහිතවූ ලියවිල්ලකින් දැනුම්දිය යුතුයි.

අයිතිවාසිකම් සථිර කිරීමට අදාලවන ඔප්පු, ලියකියවිලි ආදිය විභාගය පවත්වන වේලාවේදී මාවෙත ඉදිරිපත් කළ යුතුයි. අංක ඒ. 1793 දරණ සැලැස්මේ පිටපතක් ඇල්පිටියේ ගම්මුලාදෑනි තැනගේ කාර්යාලයේ තැන්පත් කර ඇත.

නෙවිල් ඩේවිඩ් ජයවීර,
ආණ්ඩුවේ උප ඒජන්ත තැන,
ගාලු දිස්ත්‍රික්කය.

1960 අගෝස්තු 12 වැනි දින,
ගාලු කච්චේරිය.

---

සඳහන් අංකය: ජේ. 57 ඊ. 241/ඇල්බී. 2323.

## 1954රේ අංක 39 දරණ ඉඩම් ලබාගැනීමේ (සංශෝධිත) ආඥාපනතින් සංශෝධිත 1950 අංක 9 දරණ ඉඩම් අත්කර ගැනීමේ ආඥාපනත

### 7 වැනි වගන්තිය යටතේ දැන්වීමයි

මහාජන කාර්‍යයක් සඳහා අවශ්‍යව තිබෙන පහත සඳහන් ඉඩම ආණ්ඩුව අත්කර ගැනීමට අදහස් කරන බව 1954රේ අංක 39 දරණ ඉඩම් ලබාගැනීමේ (සංශෝධිත) ආඥාපනතින් සංශෝධිත 1950ගේ අංක 9 දරණ ඉඩම් අත්කර ගැනීමේ ආඥාපනතේ 7වැනි වගන්තියේ (1) වැනි උපවගන්තිය යටතේ මෙයින් දන්වා සිටිමි.

අත්කර ගැනීමට අදහස් කරන ඉඩමේ විස්තර:—

පහත සඳහන් ඉඩම මාතර දිස්ත්‍රික්කයේ, වැල්ලබඩ පත්තුව හා කඩවත් සතර ආදායම් නිලධාරි කොට්ඨාශයේ, ඌරුගමුව නැගෙනහිර පිහිටා තිබේ.

සැලැස්ම අංකය: මූලික සැලැස්ම අංක ඒ. 1,777

කැබැලි අංකය: 1.

ඉඩමේ නම: මුත්තාවත්ත, වඩුමුත්තලාගෙවත්ත; ඉඩමේ විස්තරය: අවුරුදු 5-10 වයසැති තේක්ක ගස් 9 ක් ද, අවුරුදු 3 කට වැඩි කොස් ගස් 8 ක් ද, අවුරුදු 10 වයසැති කොස් ගස් 6 ක් ද, අවුරුදු 30 කට වැඩිවූ පොල්ගස් 3 ක් ද, අවුරුදු 10 ක් වයසැති පොල්ගස් 12 ක් ද, අවුරුදු 5 වයසැති පොල් ගස් 31 ක් ද, පැරණි දිවුල් ගසක් ද, අවුරුදු 5 වයසැති දිවුල් ගසක් ද, අවුරුදු 30 වයසැති පුවක් ගස් 12 ක් ද, අවුරුදු 3-5 වයසැති පුවක් ගස් 26 ක් ද, අවුරුදු 30 වයසැති අඹ ගස් 2 ක් ද, අවුරුදු 5-10 වයසැති අඹ ගස් 2 ක් ද, අවුරුදු 30 වයසැති කජු ගස් 4 ක් ද, අවුරුදු 5 වයසැති කජු ගස් 2 ක් ද, අවුරුදු 10-25 වයසැති ගොරක ගස් 2 ක් ද, අවුරුදු 5-10 වයසැති කිතුල් ගස් 7 ක් ද, අවුරුදු 30 වයසැති රුක්අත්තන ගස් 1 ක් ද, අවුරුදු 5 වයසැති එණුම්දෙල්ල ගස් 1 ක් ද, අවුරුදු 10 වයසැති කැටකාල ගස් 1 ක් ද, බැම්මෙන් තැණූ උළු සෙවිළි කරණ ලද ගොඩනැගිල්ලක් සහ කොන්ක්‍රීට් වහල සහිත වැසිකිළි 2 ක් හා ළිඳක් ද ඇති ඉඩම; අයිතිකරුවන්ගේ නම් හා ලිපිනයන්: ඌරුගමුව නැගෙනහිර ග්‍රාම සංවර්ධන සමිතිය; ප්‍රමාණය: අ. 1, රූ. 2, ප. 3.6.

අත්කර ගැනීමට අදහස් කරන ඉහත කී ඉඩමට සම්බන්ධතාවන් ඇති සියලූ දෙනාම ඔවුන්ම හෝ ඔවුන් වෙනුවෙන් පෙනී සිටීමට ලිපියකින් බලය ලත් නියෝජිතයන් 1960 සැප්තැම්බර් මස 21 දින ප. ව. 1.30 ට මාතර කච්චේරියේදී මා ඉදිරියේ පෙනී සිටින මෙන් මෙයින් නියම කරමි. තවද ඉඩම පිළිබඳ සම්බන්ධතාවද එම ඉඩම පවරා ගැනීමේදී ඉල්ලන වන්දි මුදලේ විස්තර ද, ඉල්ලන වන්දි මුදලේ ප්‍රමාණය හා එය ගණන් බැලීම සම්බන්ධ විස්තර ද 1960

සැප්තැම්බර් 13 දින හෝ ඊට පෙර හෝ පිටපත් දෙකකින් යුත් දැන්වීමකින් ඔවුන්ම හෝ ඔවුන් වෙනුවෙන් පෙනී සිටීමට ලියවිල්ලකින් බලයලත් නියෝජිතයන් හෝ මට ලියා දැන්විය යුතුයයි ද නියම කරමි.

තම තමන්ගේ අයිතිවාසිකම් තහවුරු කිරීම සඳහා අවශ්‍ය සියළු ඔප්පු තිරප්පු හා අනික් ලියවිලි පරීක්ෂණයේ දී ඉදිරිපත් කළ යුතුයි.

එච්. ආර්. අමිත්,
මාතර දිස්ත්‍රික්කයේ ආණ්ඩුවේ උප ඒජන්ත.

මාතර කච්චේරිය.
1960 ජූලි මස 30 දින.

---

සඳහන් අංකය: LA 1151.

## 1950 අංක 9 දරණ ඉඩම් අත්කර ගැනීමේ ආඥාපනත

### 7 වැනි වගන්තිය යටතේ දැන්වීමයි

මහාජන කාර්‍යයක් සඳහා අවශ්‍යව තිබෙන පහත සඳහන් ඉඩම ආණ්ඩුව අත්කර ගැනීමට අදහස් කරන බව 1950 අංක 9 දරණ ඉඩම් අත්කර ගැනීමේ ආඥාපනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තිය යටතේ මෙයින් දන්වා සිටිමි.

අත්කර ගැනීමට අදහස් කරන ඉඩමේ විස්තර :—

යාපනය දිසාවේ වලිකාමම් උතුර ප්‍රදේශයේ කන්කසන්තුරේ සුළු නගර සභා සීමාව තුළ පිහිටි අලඩිකාඩු නමැති ප්‍රමාණයෙන් අක්කර 1, රූ. 3, ප. 15.2ක් පමණැති ඉඩමකි.

මෙය PPA 2207 දරණ සැලැස්මේ 1 සිට 8 දක්වා නම්කොට ඇති කොටස් ය.

ඉඩම අයිතිකරුවන්ගේ නාමාවලිය :

1. විසෙන්ති සෙබමාලෙයි, 2. ඥානමුත්තු වික්ටෝරියා, 3. සින්නයියා මහාලිංගම්, 4. තුරෙසාමි මුරුගේසු, 5. සින්නතම්බි කන්දසාමි, 6. සරවනමුත්තු සෙල්වරාජා, 7. මුත්තයියා රාමසාමි,

මේ සියල්ලෝම කන්කසන්තුරේ මයිලිඩ්ඩි මෙරළබඩ පදිංචි අයය.

අත්කර ගැනීමට අදහස් කරන ඉහත කී ඉඩමට සම්බන්ධතාවන් ඇති සියලු දෙනාම ඔවුන්ම හෝ ඔවුන් වෙනුවෙන් පෙනී සිටීමට ලිපියකින් බලය ලත් නියෝජිතයන් 1960වේ ඔක්තෝබර් මස 4 වන දින පෙරවරු 10.30ට කන්කසන්තුරේ නානායම් පළේදී මා ඉදිරියේ පෙනී සිටින මෙන් මෙයින් නියම කරමි. තවද ඉඩම පිළිබඳ සම්බන්ධතාවද එම ඉඩම පවරා ගැනීමේදී ඉල්ලන වන්දි මුදලේ විස්තර ද, ඉල්ලන වන්දි මුදලේ ප්‍රමාණය හා එය ගණන් බැලීම සම්බන්ධ විස්තරද 1960 සැප්තැම්බර 11 වන දින හෝ ඊට පෙර හෝ පිටපත් දෙකකින් යුත් දැන්වීමකින් මට ලියා දැන්විය යුතුයයි ද නියම කරමි. මෙකී විස්තර යනාදිය මෙහි සඳහන් කළ විමසීමේදී ඉදිරිපත් කළ යුතුයි.

ඒ. ටී. මූර්ති,
යාපනය දිස්ත්‍රික්කයේ ආණ්ඩුවේ
උප ඒජන්ත.

යාපනය කච්චේරිය,
1960 අගෝස්තු මස 4වන දාය.

---

සඳහන් අංකය: ඇල්. ආර්. 1697.

## 1954 අංක 39 දරණ ඉඩම් ලබාගැනීමේ (සංශොධිත) ආඥාපනතින් සංශොධනය කරන ලද 1950යේ අංක 9 දරණ ඉඩම් අත්කර ගැනීමේ ආඥාපනත

### 7 වැනි වගන්තිය යටතේ දැන්වීමයි

මහාජන කාර්‍යයක් සඳහා අවශ්‍යව තිබෙන පහත සඳහන් ඉඩම් ආණ්ඩුව අත්කර ගැනීමට අදහස් කරන බව 1954 අංක 39 දරණ ඉඩම් ලබාගැනීමේ (සංශොධිත) ආඥාපනතින් සංශොධනය කරන ලද පරිදි 1950 අංක 9 දරණ ඉඩම් අත්කර ගැනීමේ ආඥාපනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තිය යටතේ මෙයින් දන්වා සිටිමි.

ලබාගැනීමට අදහස් කර ඇති ඉඩම්වල විස්තර :—

මැදවච්චිය ගමේ ඇෆ්ප්. වී. පී. 113 දරණ ප්ලෑනේ 1 වැනි අතිරේකය

**ලොට් අංකය : 61.**

ඉඩමේ නම : මැදවච්චිය කැලේ ; ඉඩමේ විස්තර : අවු. 1ක් වයස කෙසෙල් පඳුර, අවු. 7ක් වයස මුරුන්ගා ගස් 7ක් සහ 1 පොල් ගසක් ද වේ. වතු ඉඩම ; හිමිකම් කියන්නාගේ නම : මැදවච්චියේ ආර්. ජී. ගුණවර්ධන, බදු බලපත්‍ර අංක 7, ප්‍රමාණය : අ. 0, රූ. 0, ප. 5.1.

**ලොට් අංකය : 62.**

ඉඩමේ නම : මැදවච්චිය කැලේ ; විස්තර : මුඩුබිම ; හිමිකම් කියන්නාගේ නම : ඒ. අබ්දුල් මජීදු, මැදවච්චිය, බදුබලපත්‍ර අංක 120. ප්‍රමාණය : අ. 0, රූ. 2, ප. 9.3.

**ලොට් අංකය : 63.**

ඉඩමේ නම : මැදවච්චිය කැලේ ; විස්තර : දෙහිගස් 2යි, අවු. 8ක් වයස, අවු. 5ක් වයස දෙඩම් ගස් 3යි, දෙළුන් ගස් 1යි, අවු. 6ක් වයසැති සවිර වැසිකිළි 1යි, එළවන් බඳින ගාල් 2යි, වතු ඉඩම ; හිමිකම් කියන්නාගේ නම : මැදවච්චියේ ඇල්. ආරුමුගම්, බදු බලපත්‍ර අංක 328 ; ප්‍රමාණය : අ. 0, රූ. 0, ප. 22.7.

**ලොට් අංකය : 65.**

ඉඩමේ නම : මැදවච්චිය කැලේ ; විස්තර : කොහොඹගස් දෙකයි අවු. 5ක් පමණ වූ දෙහි ගස් දෙකද ඇති වත්ත ; හිමිකම් කියන්නාගේ නම : ඇල්. ආරුමුගම්, මැදවච්චිය, බදු බලපත්‍ර අංක 428 ; ප්‍රමාණය : අ. 0, රූ. 0, ප. 5.5.

**ලොට් අංකය : 70.**

ඉඩමේ නම : කුඹුක්ගහඉඩම ; විස්තර : තල් ගස් 12යි, අවු. 3යි, කෙසෙල් පඳුරු 25යි, බිලිං ගස් 1යි, අවු. 1යි, බෙලි ගස් 1යි, කොහොඹගස් 1යි, දෙහි ගස් 4යි, දෙළුම් ගස් 3යි, පේරගස් 9යි, අවු. 1-3 වයසයි, අඹගස් 6යි, කොස් ගස් 5යි, පුවක් ගස් 22යි, අවු. 10ක් පමණ වූ පොල් ගස් 19යි, අවු. 15ක් පමණ වයස් වූ දෙඩම් ගස් 4යි, අවු. 4ක් වයස්වූ සහ මැටි ගෙයක් ද ගාලක් ද ඇති වතු ඉඩම ; හිමිකම් කියන්නාගේ නම : ඊ. මුත්තිසාමි, මැදවච්චිය, බදු බලපත්‍ර අංකය 123, ඒ. මීරා මෝහිදීන්, මැදවච්චිය, බදු බලපත්‍ර අංක 20/113 ; ප්‍රමාණය : අ. 1, රූ. 0, ප. 18.

**ලොට් අංකය : 74.**

ඉඩමේ නම : සේගුතම්බි අක්කරයේ න ; විස්තර : වතු ඉඩම සහ කුඹුරු ඉඩම, ඇස්බැස්ටෝස් සෙවිලි කළ ලී ගබඩාවක්, පොල් අතු ගෙවල් 2යි, මැටි ගෙයක කොටසක් සහ කඩයක් ද වැසිකිළිය සහ කටු කම්බි ගැසූ වැට ; හිමිකම් කියන්නාගේ නම : ඒ. ඇස්. අලිබ්‍රාම් සයිබු, ඒ. ඇස්. කාදර්මීරා සයිබු සහ ඒ. ඇස්. මොහොමඩ් සිඩ්ඩි, මැදවච්චිය ; ප්‍රමාණය : අ. 5, රූ. 3, ප. 10.8.

**ලොට් අංකය : 75.**

ඉඩමේ නම : මැදවච්චිය කඩේ, මැදවච්චිය කඩේ නිලම ; විස්තර : වතු ඉඩම සහ මැටි කඩයක් උළු වහල සහිත ; හිමිකම් කියන්නාගේ නම : ඒ. අන්නම්මා, පොසින්ට් පේදුරු ; ප්‍රමාණය : අ. 0, රූ. 0, ප. 7.2.

**ලොට් අංකය : 76.**

ඉඩමේ නම : මැදවච්චිය කඩේ, මැදවච්චිය කඩේ නිලම ; විස්තර : තල් ගස් 2යි, අවු. 10ක් පමණ වයසැති, උළු සෙවිලි කරන ලද සහ මැටි ගෙයක් ඇති වතු ඉඩම ; හිමිකම් කියන්නාගේ නම : ඒ. පරුවතිපිල්ලේ, මැදවච්චිය ; ප්‍රමාණය : අ. 0, රූ. 0, ප. 9.5.

**ලොට් අංකය : 77.**

ඉඩමේ නම : මැදවච්චිය කඩේ, මැදවච්චිය කඩේ නිලම ; විස්තර : මුඩු බිම ; හිමිකම් කියන්නාගේ නම : ආර්. ජී. රොසලින් නෝනා, ආර්. ජී. ගුණවර්ධන, ආර්. ජී. සිරිවර්ධන සහ එච්. ජී. පී. ජිනදාස, මැදවච්චිය ; ප්‍රමාණය : අ. 0, රූ. 0, ප. 4.7.

**ලොට් අංකය : 78.**

ඉඩමේ නම : මැදවච්චිය කඩේ ; විස්තර : අවු. 2ක් වයසැති පොල් ගස් 1යි, කෙසෙල් ගස් 4යි, පැපොල් ගස් 1යි, අවු. 1 වයසැති සහ මැටියෙන් තනන ලද ගවගාල් 2යි, වතු ඉඩම ; හිමිකම් කියන්නාගේ නම : ඇස්. වන්නියාගම් පිල්ලේ සහ කේ. නඩරාජා, මැදවච්චිය ; ප්‍රමාණය : අ. 0, රූ. 0, ප. 8.7.

**ලොට් අංකය : 79.**

ඉඩමේ නම : මැදවච්චිය කඩේ ; විස්තර : අවු. 5ක් වයසැති දෙහි ගස් එකයි, අවු. 15 වයසැති තල් ගස් 1යි, මැටියෙන් කරන ලද පදිංචි ගෙවල් එකයි, යන මේවා ඇති වතු ඉඩම ; හිමිකම් කියන්නාගේ නම : කේ. මොහොම්මදු මීරා සයිබු, මැදවච්චිය ; ප්‍රමාණය : අ. 0, රූ. 0, ප. 10.3.

අත්කර ගැනීමට අදහස් කරන ඉහත කී ඉඩම්වලට සම්බන්ධතාවන් ඇති සියලු දෙනාම ඔවුන්ම හෝ ඔවුන් වෙනුවෙන් පෙනී සිටීමට ලිපියකින් බලය ලත් නියෝජිතයන් 1960 සැප්තැම්බර් මස 14 දින පෙරවරු 10ට මැදවච්චිය නානායමේදී මා ඉදිරියේ පෙනී සිටින මෙන් මෙයින් නියම කරමි. තවද ඉඩම් පිළිබඳ සම්බන්ධතාවද එම ඉඩම් පවරා ගැනීමේදී ඉල්ලන වන්දි මුදලේ විස්තර ද, ඉල්ලන වන්දි මුදලේ ප්‍රමාණය හා එය ගණන් බැලීම සම්බන්ධ විස්තර ද 1960.9.7 වන දින හෝ ඊට පෙර හෝ පිටපත් දෙකකින් යුත් දැන්වීමකින් මට ලියා දැන්විය යුතුයයි ද නියම කරමි.

එච්. එල්. ගුණසේකර,
අනුරාධපුර දිස්ත්‍රික්කයේ අතිරේක උප දිසාපති.

අනුරාධපුර කච්චේරිය,
1960 අගෝස්තු මස 4 වන දින.

ඇල්. ඒ. 396.

**1954රේ අංක 39 දරණ ඉඩම් රජය සන්තක කිරීමේ (සංශොධිත) ආඥපනතින් සංශොධිත වූ 1950හේ අංක 9 දරණ ඉඩම් ලබාගැනීමේ ආඥපනත**

**7 වැනි වගන්තිය යටතේ වූ දැන්වීමයි**

පොදු කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දක්වෙන ඉඩම ලබාගැනීමට ආණ්ඩුව අදහස් කරන බැව් 1954රේ අංක 39 දරණ ඉඩම් රජය සන්තක කිරීමේ (සංශොධිත) ආඥපනතින් සංශොධිත වූ, 1950හේ අංක 9 දරණ ඉඩම් ලබාගැනීමේ ආඥපනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

ලබාගැනීමට බලාපොරොත්තු වන ඉඩමේ විස්තර :—

ඌව පලාත, බදුලු දිස්ත්‍රික්කය, යටිකිඳ ආදායම් නිලධාරි කොට්ඨාශය, බෝගොඩ කෝරලේ, වැගම ගම, ඇෆ්ප්. වී. පී. 382 සහ පීපී 1507ට අතිරේක අංක 4.

**කැබැලි අංකය 652**

ඉඩමේ නම : හීන් අරාවේ කුඩා රඹුක් කුඹුර ; විස්තරය : ඉඩමෙන් කොටසක් වැවිල්ලක් නොමැත ; හිමිකම් කියන අය : කේ. රසීදු, ජගුල්ල, හාලිඇල ; බිම් ප්‍රමාණය : අ. 0, රූ. 0, ප. 03.7.

**මුළු ගණන අ. 0, රූ. 0, ප. 03.7**

ඉහත සඳහන් ඉඩමට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලු දෙනාම තම තමන් හෝ ඔවුන්ගෙන් ලියවිලිවලින් බලය ලත් අයවලුන් හෝ 1960 සැප්තැම්බර් 7 වැනි දින පූ.භා. 10ට බදුල්ලේ කච්චේරියේදී මා සම්මුඛ විය යුතුයි.

තවද, 1960 අගෝස්තු 31 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල සවභාවයත් එකී ඉඩම ලබාගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත් වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත් මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම්දිය යුතුයි.

තවද, ඒ සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම් තහවුරු කර ගැනීම පිණිස සහ එකී ඉඩම් ගැන ඔවුන් විසින් ඉල්ලනු ලබන වන්දි මුදල් ප්‍රමාණය සම්බන්ධයෙන් පවත්වනු ලබන විභාගයේදී ඉදිරිපත් කල යුතුයි.

ඇල්. අයි. ජේ. සිල්වා,
ආණ්ඩුවේ උප ඒජන්ත තැන.

1960 ජූලි මස 28 වැනි දින,
බදුල්ල කච්චේරිය,

---

අංකය: ඇල්. ඒ. 9.

**1954රේ අඬක 39 දරණ ඉඩම් රජය සන්තක කිරීමේ (සංශොධිත) අඥපණතින් සංශොධිත වූ 1950හේ අඬක 9 දරණ ඉඩම් ලබාගැනීමේ ආඥපණත**

**7 වැනි වගන්තිය යටතේ වූ දැන්වීමයි**

පොදු කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දක්වෙන ඉඩම් ලබාගැනීමට ආණ්ඩුව අදහස් කරන බැව්, 1954රේ අඬක 39 දරණ ඉඩම් රජය සන්තක කිරීමේ (සංශොධිත) ආඥපනතින් සංශොධිත වූ, 1950හේ අඬක 9 දරණ ඉඩම් ලබාගැනීමේ ආඥපණතේ 7 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

ලබාගැනීමට බලාපොරොත්තු වන ඉඩම්වල විස්තර:—

ඌව පලාතේ, බදුලු දිස්ත්‍රිකකයේ, යටිකිඳ ආදායම් නිලධාරි කොට්ඨාශයේ, රිල්පොල කෝරලේ, වැදිගුනෙගම, ඇෆ්ප්. වී. පී. 170 ට අතිරේක අංක 12

**කැබැලි අංකය : 165.**

ඉඩමේ නම : වේවැස්සවත්ත ; විස්තරය : අවුරුදු 40 ක පමණ පැරණි තේ ඉඩම, පොලව යටින් ජලනළයක් ඇත; හිමිකම් කියන අය : සීමා සහිත රජවැල්ල නිෂ්පාදන සමාගම, ඒජන්තවරු : සීමාසහිත ගෝඩන් ෆේප්‍රසරි සහ සමාගම, කොළඹ ; ප්‍රමාණය : අ. 0, රූ. 0, ප. 22.5.

**කැබැලි අංකය : 168.**

ඉඩමේ නම : වේවැස්සවත්ත ; විස්තරය : තේ (වැවිල්ලක් නොමැත). පොලව යටින් ජලනලයක් ඇත ; හිමිකම් කියන අය : සීමා සහිත රජවැල්ල නිෂ්පාදන සමාගම, ඒජන්තවරු : සීමාසහිත ගෝඩන් ෆේප්‍රසර් සහ සමාගම, කොළඹ ; ප්‍රමාණය : අ. 0, රූ. 0, ප. 0.2.

**කැබැලි අංකය : 169**

ඉඩමේ නම : වේවැස්සවත්ත ; විස්තරය : තේ (වැවිල්ලක් නොමැත), වතුර ටැන්කියකින් කොටසක් අයත් වේ ; හිමිකම් කියන අය : සීමාසහිත රජවැල්ල නිෂ්පාදන සමාගම, ඒජන්තවරු : සීමාසහිත ගෝඩන් ෆේප්‍රසරි සහ සමාගම, කොළඹ ; ප්‍රමාණය : අ. 0, රූ. 0, ප. 21.9.

**එකතුව ප්‍රමාණය : අ. 0, රූ. 1, ප. 04.6.**

ඉහත සඳහන් ඉඩම්වලට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලුදෙනාම තම තමන් හෝ ඔවුන්ගෙන් ලියවිලිවලින් බලය ලත් අයවලුන් හෝ 1960 සැප්තැම්බර් 7 වැනි දින පූ. භා. 10 ට බදුල්ලේ, කච්චේරියේ දී මා සම්මුඛ විය යුතුයි.

තවද, 1960 අගෝස්තු 31 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම් සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල සවාභාවයත් එකී ඉඩම් ලබාගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත් වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත් මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම්දිය යුතුයි. තවද, ඒ ඉඩම සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසි කම් තහවුරු කර ගැනීම සහ එකී ඉඩම් ගැන ඔවුන් විසින් ඉල්ලනු ලබන වන්දි මුදල් ප්‍රමාණය සම්බන්ධයෙන් සියලුම ඔප්පු සහ ලියකියවිලිද මේ සම්බන්ධයෙන් පවත්වනු ලබන විභාගයේදී ඉදිරිපත් කල යුතුයි.

ඇල්. අයි. ජේ. සිල්වා,
බදුළු දිසාවේ ආණ්ඩුවේ උප ඒජන්ත තැන.

1960 අගෝස්තු 3 වැනි දින,
බදුලු කච්චේරිය.

---

## ඉඩම් සංවර්ධන ආඥපනත යටතේ දැන්වීම

මගේ අංකය : ඇල්. ආර්. ඕ/ඒ. පී. ඇල්. 4982.
දිසාපතිගේ අංකය : ඇල්. එච්/ඇල්.ආර්.ඕ/158.

**දීමනා පත්‍ර ලැබීමට සුදුස්සන් තේරීම පිළිබඳ ඉඩම් කච්චේරියේ නිවේදනයයි**

පහත විස්තර කර ඇති ආණ්ඩුවේ ඉඩම් සඳහා දීමනා නිකුත් කිරීම පිණිස පුද්ගලයින් තේරීම් වස්, 1960.9.5 වැනි සඳුදින පෙරවරු 10 ට මහනුවර ආණ්ඩුවේ දිසාපතිතුමා විසින් මහනුවර කච්චේරියේ දී ඉඩම් සංවර්ධන ආඥපනත යටතේ ඉඩම් කච්චේරියක් පවත්වනු ලබන බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

2. 1948 වේ ඉඩම් නිදහස් කිරීමේ නීති රීති සංග්‍රහයෙහි 3 වෙනි නීතියෙන් සහ 1942 කේ අංක 61 දරණ ඉඩම් නිදහස් කිරීමේ ආඥපනතේ අංක 5 (1) දරණ කොටසින් සංශෝධිත ඉහත සඳහන් ආඥපනතේ පළමුවැනි උපලේඛනයේ කොන්දේසිවලට මෙම දීමනා යටත්වේ.

3. සෑම ඉල්ලුම්කරුවකුම පුද්ගලිකව ඉඩම් කච්චේරියට පැමිණිය යුතුය. නැතහොත් ඉල්ලුම්කරු වෙනුවෙන් නියෝජිතයෙකු පෙනී සිටිය යුතුය.

4. ඉඩම් කච්චේරි පිළිබඳ විමසීම් මහනුවර ආණ්ඩුවේ දිසාපතිතුමා වෙත ඉදිරිපත් කළ යුතුය.

අ. ච. ල. අභයසුන්දර,
සහකාර ඉඩම් කොමසාරිස්.

1960.8.5 වෙනි දින,
කොළඹදීය.

**ඉඩම පිළිබඳ විස්තර**

| | |
|---|---|
| **ඉඩම් කොමසාරිස්ගේ අංකය :** | ඇල්. ආර්. ඕ/ඒ. පී. ඇල්. 4,982. |
| **කැබලි අංකය :** | 4 සහ 5. |
| **පිඹුරු අංකය :** | ඒ. 2,381 මූලික පිඹුර. |
| **ඉඩම් පිහිටීම :** | මහනුවර දිස්ත්‍රික්කයේ, උඩබුලත්ගම කොට්ඨාශයේ, පස්බාගේ කෝරලයේ, නාවලපිටිය නගර සීමාවේ අංක 7 කොටසේ සොයිසකැලේ සහ අංක 5 කොටසේ කරහඳුන්ගල. |
| **ගමේ නම ;** | කරහඳුන්ගල ගමේ (කොටස) |
| **ඉඩම් ප්‍රමාණය :** | අක්කර 1, රූඩ් 1, පර්චස් 36.07. |
| **ඉල්ලුම්කරුගේ නම සහ ලිපිනය :** | ඒ. ඇල්. ඇම්. කාසිම්, ක්වීන්ස් බෙරි වත්ත, කොත්මලේ. |

## මධ්‍යම පංක්ති ක්‍රමය යටතේ ඉඩම් ලැබීමට සුදුස්සන් තෝරීම සඳහා ඉඩම් කච්චේරි දැනුම් දීමයි

ඉඩම් සංවර්ධන ආඥාපනත යටතේ පහත විස්තර දැක්වෙන ඉඩම් ලැබීමට සුදුස්සන් තෝරීම සඳහා පුත්තලමේ ආණ්ඩුවේ ඒජන්ත තුමා විසින් ඉල්ලුම් පත් කැඳවනු ලැබේ. ඉඩම් කච්චේරිය පවත්වන දිනය හා වේලාව ඉල්ලුම් කරුවනට යථා කාලයේදී දන්වනු ඇත.

2. පුත්තලම් දිස්ත්‍රික්කයේ අඩුම වශයෙන් අවුරුදු 3ක ස්ථිර පදිංචියක් ඇති සුළු මධ්‍යම පංතියේ ලාංකිකයන්ට ඉල්ලීම් සීමාවේ.

3. රුපියල් 2,000කට වැඩි සහ රුපියල් 4,800කට අඩු වාර්ෂික ආදායමක් ඇති අය පමණක් ඉල්ලුම් කළ යුතුයි. විවාහක අයට පුරුෂයාගේ සහ භාර්යාවගේ වාර්ෂික ආදායම රු. 6,000කට වැඩි නොවිය යුතුයි.

4. ඉල්ලුම් පත්‍ර ලියාපදිංචි කළ තැපෑලෙන් එවිය යුතුයි. කවරයේ වම් කොනෙහි "කෙලුතෝඩෙයි සුළු මධ්‍යම පංති ව්‍යාපාරයේ ඉඩම් සඳහා ඉල්ලීම්" යනුවෙන් සඳහන් කළ යුතුය. ඉල්ලුම් පත්‍ර පහත සඳහන් නියමිත පෝර්මයට අනුව විය යුතුයි.

5. සෑම ඉල්ලුම් පතක්ම 1960වේ සැප්තැම්බර් මස 20 වැනි දින හෝ ඊට ප්‍රථම පුත්තලමේ කච්චේරියේ ආණ්ඩුවේ ඒජන්ත තුමා වෙත එවිය යුතුය.

6. තෝරාගත් ඉල්ලුම් කරුවකුට ඉඩම් අක්කර 10ය බැගින් භාර දෙනු ලැබේ. ඉඩම භාරගෙන අවුරුද්දක් ඇතුළතදී ඉල්ලුම්කරු විසින් ඉඩම කට්ටිය සම්පූර්ණයෙන් එළිකොට, ගිනිදමා, වැට කඩුළු බැඳ එහි පොල් හෝ වෙනත් ආර්ථික වැවිලි වගා කිරීම බලාපොරොත්තු වේ. ඉන්පසු ඔහු විසින් වැවිලි සියල්ලම හොඳින් පවත්වාගෙන යා යුතුයි.

7. ඉල්ලුම් කරුවන්ට ඉඩම් කච්චේරියේ දිනය හා වේලාව දැනුම් දුන් පසු සෑම ඉල්ලුම් කරුවෙකුම තමාම හෝ තමා වෙනුවෙන් පත් කළ කෙනෙකු හෝ ඉඩම් කච්චේරියේදී ඉදිරිපත් විය යුතුයි. එසේ ඉල්ලුම්කරු හෝ ඔහු වෙනුවෙන් පෙනී සිටීමට පත් කළ කෙනෙකු ඉඩම් කච්චේරියට නොපැමිණියේ නම්, ඉල්ලුම්කරු තමාගේ ඉල්ලීම වැඩි දුරටත් කරගෙන යාමට නොකැමති බවට ආණ්ඩුවේ ඒජන්ත තුමා ඒත්තු ගන්නවා ඇත.

8. මේ ඉඩම් කච්චේරි පිළිබඳ විමසීම් පුත්තලමේ ආණ්ඩුවේ ඒජන්ත තුමා වෙත යැවිය යුතුයි.

9. ඉල්ලුම් පත්‍රයේ යම් වැරදි කරුණක් අඩංගු කර තිබේ නම්, එය ඉල්ලීම මුලින්ම ප්‍රතික්ෂෙප කිරීමට හෝ තෝරා ගතහොත් ඒ තේරීම අවලංගු කිරීමට හේතු වෙනවා ඇත.

10. බෙදාදීමට තිබෙන ඉඩමේ විස්තර :—

කල්පිටියේ ප්‍රා. ආ. නි. තැනගේ කෝට්ඨාශයේ, පොම්පරිප්පු පත්තුවේ, කරතිව් ගම්මුලාදෑනි තැනගේ වසමේ වනාතවිල්ලු-කරතිව් පාරට දකුණින් පිහිටි අක්කර 700ක් විශාල කෙලුතොඩෙයි ඉඩම.

පී. එච්. ප්‍රේමවර්ධන,
ආණ්ඩුවේ ඒජන්තතුමා වෙනුවට.
පුත්තලම.

1960 අගෝස්තු මස 4 දින,
පුත්තලම් කච්චේරියේදීය.

### ඉල්ලීමේ පෝර්මය

1. ඉල්ලුම්කරුගේ නම :————.
2. ලිපිනය :————.
3. වයස :————.
4. නඩත්තුවන අය :————.
5. රක්ෂාව :————.
6. වාර්ෂික ආදායම (අන්තිම ආදායම් බදු වාර්තාව තිබේ නම් එය අමුනන්න) :————.
7. ඉඩම් සංවර්ධන කිරීමට ඉල්ලුම්කරු ලඟ වැය කිරීමට ඇති මුදල :————.
8. ඉල්ලුම්කරුට හා ඔහුගේ භාර්යාවට අයිති දේපල (ඉඩම් සංවර්ධන ආඥාපනත යටතේ ඇති ඉඩම් ද ඇතුලු බදු දේපල ඇතුළත් කළ යුතුයි) :————.
9. විශේෂ ඉල්ලීම :————.

————,
ඉල්ලුම්කරුගේ අත්සන.

දිනය :————.

## ඉඩම් පිළිබඳ විවිධ දැන්වීම්

අංකය: ඇල්. ඇස්. 4394.

### 21 (2) වැනි රජයේ ඉඩම් රෙගුලාසිය යටතේ කරන නිවේදනයයි

කළුතර දිස්ත්‍රික්කයේ අගලවත්ත ප්‍රාදේශිය ආදායම් නිලධාරි කොට්ඨාශයේ කිතුල්ගොඩ පිහිටි 126 දරණ අවසාන ගම් පිඹුරයේ අංක 237 බී දරණ ඉඩම් කට්ටියෙන් අක්කර 1 ක පමණ බිම් කැබැල්ලක් පේෂකම් මධ්‍යස්ථානයක් පිහිටුවීම සඳහා කිතුල්ගොඩ ග්‍රාම සංවර්ධන සමිතියේ භාරකරුවන් වන අගලවත්තේ කිතුල්ගොඩ පදිංචි හෙට්ටිආරච්චිගේ සිමන් සහ විතානගේ දෙන් සිඩින් ධම්දාස යන මහතුන් විසින් බදු ඉල්ලා ඇති බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

2. ඉල්ලුම්කර ඇති ඉඩම මෙම කරුණ සඳහා බදු දීමට තිබේ. සෙසු කොන්දේසි වලට අමතර වශයෙන් හා පහත සඳහන් කොන්දේසි වලට ද යටත් කොට බද්ද දීමට තීරණය කර ඇත:—

(අ) කාලය: අවුරුදු 5 යි;

(ආ) බද්ද: අවුරුද්දකට රු. 1.50 යි;

(ඉ) බදු ගන්නන් විසින් බද්ද ආරම්භ වී අවුරුද්දක් ඇතුලත කළුතර දිසාපතිගේ සිත් ගන්නා පරිද්දෙන් මෙම ඉඩමෙහි පේෂකර්ම මධ්‍යස්ථානයක් තනා නිම කළ යුතුයි;

(ඊ) බදු ගන්නන් විසින් මෙම ඉඩමෙහි තිබී යම්කිසි පුරාවස්තුවක් ලැබෙතොත් එය වහාම පුරා විද්‍යා කොමසාරිස් තුමාට භාර දිය යුතුය;

(උ) බදු ගන්නන් විසින් මෙම ඉඩම පේෂකර්ම මධ්‍යස්ථානයක් වශයෙන් යොදනවා විනා අන් කිසි කරුණක් සඳහා නො යෙදිය යුතුය.

3. මෙහි සඳහන් දින සිට සති 6 ක් ඇතුලත මෙම ඉඩම බදු නො දිය යුතු බවට පිළිගැනෙන හේතු ලියා මා වෙත ඉදිරිපත් නොකළහොත් ඉල්ලීම අනුව බද්ද දෙනු ලැබේ.

වී. රාමනාදන්,
ඉඩම් කොමසාරිස් වෙනුවට.

1960 අගෝස්තු මස 12 වැනි දින,
කොළඹ දීය.

---

අංකය : ඇල්. ජේ. 1164—ඇල්. ඇම්. 1878.

### 21 (2) වැනි රජයේ ඉඩම් රෙගුලාසිය යටතේ කරන නිවේදනයයි

කළුතර දිස්ත්‍රික්කයේ, පඹේ, ගල්අස්ස ගමෙහි අංක ඇස් 3,978 දරණ මූලික පිඹුරයේ, අංක 5 දරණ බිම් කැබැල්ලෙන් අක්කර 1/2 ක් පමණ වූ රජයේ ඉඩම් කැබැල්ලක්, කළුතර වනවාස විහාර සංඝ සභාවේ භාරකරුවන් වන, කළුතර පදිංචි, ඩබ්ලිව්. කේ. විජේමාන්න සහ පයාගල පදිංචි, ඇෆ්. වික්‍රමසිංහ යන මහතුන් විසින් එහි විහාරස්ථානයක් සහ ඉරුදින පාසලක් පිහිටුවීම සඳහා බදු ඉල්ලා ඇත.

2. මීට කිට්ටුම වූ බෞද්ධ විහාරස්ථානය පිහිටා ඇත්තේ මෙහි සිට සැතපුම් 2 ක් පමණ ඈතිනි. යෝජිත විහාරස්ථානය පඹේ ජනපදයෙහි පදිංචි කට්ටි කරුවන්ට ප්‍රයෝජනවත් වේ. ඉඩම ඒ සඳහා බදු දීමට තිබේ. එබැවින්, රජයේ සම්මත සෙසු කොන්දේසි වලට අමතර වශයෙන් හා පහත සඳහන් කොන්දේසිවලට ද යටත් කොට ඉඩම බදු දීමට රජය අදහස් කොට ඇත :—

(අ) බදු මුදල : වර්ෂයකට රු. 1 යි.

(ආ) බදු ගන්නන් විසින්, බද්ද ඇරඹුනු දින සිට, අවුරුදු 2 ක් ඇතුළත දී, කළුතර දිසාපති තැනගේ සිත් ගන්නා පරිදි, ඉඩමෙහි, ආවාසයක් සහ ඉරුදින පාසලක් සඳහා ගොඩනැගිල්ලක් තනා නිම කළ යුතු ය.

(ඉ) බදුගන්නන් විසින් මෙම ඉඩම විහාරස්ථානයක් සහ ඉරුදින පාසලක් සඳහා මිස අන් කිසිවක් සඳහා නොයෙදවිය යුතුයි.

(ඊ) බදු ගන්නන් විසින් (ආ) ඡේදයෙහි සඳහන් ගොඩනැගිලි සාදා නිම කොට, සමසක් ඇතුළත, ඒවා මහා භාරකාර තැනගේ අනුමැතිය ලද ඔප්පුවකින් පූජා කළ යුතුය. මෙසේ කළ පසු, ප්‍රස්ථාවේ හැටියට, භාරකාර තැනට හෝ විහාරස්ථානයේ පාලක විහාරාධිපතීන් වහන්සේට හෝ ඉඩම සඳහා 99 අවුරුද්දක බද්දක් දෙනු ලැබේ.

3. මෙහි පහත දැක්වෙන දිනයේ සිට සති 6 ක් ඇතුළත දී මෙකී ඉඩම බදු නොදිය යුතු බවට පිළිගැනෙන හේතු මා වෙත ලියා ඉදිරිපත් නොකළහොත් යථෝක්ත ඉල්ලීම පරිදි ඉඩම බදු දෙනු ලැබේ.

වී. රාමනාදන්,
ඉඩම් කොමසාරිස් වෙනුවට.

1960 අගෝස්තු මස 12 වෙනි දින,
කොළඹ දීය.

අංකය : ඇල් කේ 298.

## 1948 රජයේ ඉඩම් පනතේ 21(2) වැනි රෙගුලාසිය යටතේ කරන නිවේදනයයි

නුවරඑළි දිස්ත්‍රික්කයේ යටි පලාත කෝරලේ ගරස්බැද්ද නම් ගමේ පිහිටි අංක 250 දරණ අවසාන ගම් සිතියමේ අංක 53 දරණ රජයේ බිම් කට්ටියෙන් අක්කර 0, රූඩ් 1, පර්චස් 10ක් පමණ වූ කොටසක් දීර්ඝ කාලීන බද්දට දෙන ලෙස නිල්දන්ඩාහින්න එගොඩකුන්දේ පදිංචි එච්. ඇල්. ප්‍රේමරත්න මහතා ඉල්ලා සිටින බැව් මෙයින් දන්වමි.

2. මේ ඉඩම එච්. ඇල්. ප්‍රේමරත්න මහතාගේ පියා වන නැසීගිය එච්. ඇල්. ඩී. අප්පුහාමි මහතාට 1936යේදී ජී.ඒ—සී 144 දරණ බලපත්‍රයකින් බදු දෙන ලදී. දනට ඉඩමේ රු. 4,500ක් පමණ වටිනා කඩ පෙලක් ඇත. අන්තිම කැමති පත්‍රයක් නොලියා 1955 දී නැසීගිය මුල් බලපත්‍රකරුගේ අනිත් උරුමක්කාරයින් ඉල්ලුම්කරුට ඉඩම බදු දීමට කැමැත්ත දක්වා ඇත. බල පත්‍රයක් යටතේ භුක්තිය තවදුරටත් නොගැලපෙන නිසා ආණ්ඩුවේ නියමිත කොන්දේසි අතර පහත සඳහන් කොන්දේසිවලටද යටත් කර මේ ඉඩම දීර්ඝ කාලීන බදු ක්‍රමයට දීමට අදහස් කරනු ලැබේ :—

(අ) කාලය : 1959.1.1 සිට අවුරුදු 99යි ;

(ඉ) බද්ද : වසකට රුපියල් 15යි. මෙම බද්ද අවුරුදු 10කට වරක් සංශෝධනය කරනු ලැබේ. මෙසේ සංශෝධනය කරන බද්ද ඊට පෙර අවුරුදු 10යේ කාලසීමාව තුළ බද්දට වඩා සියයට පනහකට වඩා වැඩි නොවිය යුතුය ;

(උ) බදුකාරයා විසින් මේ ඉඩම වෙළඳ සැලක් පවත්වා ගෙන යාම පිණිස මිස අන් කටයුත්තක් සඳහා පාවිච්චි නොකළ යුතුයි.

3. මෙහි සඳහන් දිනයේ පටන් සති හයක් ඇතුළතදී ඉඩම් කැබැල්ල නොදිය යුතු බවට සැහෙන හේතු ලියා මා වෙත ඉදිරිපත් නොකළහොත් මේ ඉල්ලීම අනුව බද්ද දෙන්නෙමි.

ඊ. කේ. ආර්. අසරප්පා,
ඉඩම් කොමසාරිස් වෙනුවට.

1960 අගෝස්තු 12 වෙනි දින,
ඉඩම් කොමසාරිස් තැනගේ කායසීලය,
කොළඹ:

---

අංකය : ඇල්. කේ. 483.

## රජයේ ඉඩම් පිළිබඳ රෙගුලාසිවල 21(2) වෙනි රෙගුලාසිය යටතේ කරන නිවේදනයයි

නුවරඑළිය දිස්ත්‍රික්කයේ බ්ලැක්පූල් නම් ගමේ පිහිටි අංක පී.පී. ඒ 953 දරන මූලික පිඹුරයේ අ. 0, රූ. 2, ප. 30ක් පමණ වූ අංක 62 දරන බිම්කට්ටිය බද්දට දෙන ලෙස නුවරඑළියේ බ්ලැක්පූල්හි පදිංචි ඇම්. ඒ. සයිමන් සිංඤෝ මහතා ඉල්ලා සිටින බැව් මෙයින් දන්වමි.

2. රුපියල් 3,500 පමණ වටිනා ගොඩනැගිල්ලක් ඇති මෙම ඉඩම 1923නේ සිට ජී.ඒ—සී 144 දරණ බලපත්‍රයක් මත ඉල්ලුම්කරුට දී තිබුණි. එතැන් පටන් ඔහු මේ ඉඩමේ සහ ගොඩනැගිල්ලේ පදිංචි වී සිටී. බලපත්‍රයක් යටතේ භුක්තිය තවදුරටත් නොගැලපෙන නිසා ආණ්ඩුවේ නියමිත කොන්දේසි අතර පහත සඳහන් කොන්දේසි වලට ද යටත් කර මේ ඉඩම බදු දීමට අදහස් කරනු ලැබේ :—

(අ) කාලය : 1960 ජනවාරි 1 වෙනිදා සිට අවුරුදු 99යි ;

(ඉ) බද්ද : වසකට රු. 27.50යි. මෙම බද්ද අවුරුදු 30ට වරක් සංශෝධනය කරනු ඇත. සංශෝධිත බද්ද ඊට පෙර අවුරුදු 30ගේ කාල සීමාව තුළ ගෙවීමට තිබුණු බද්දට වඩා සියයට පනහකට වඩා වැඩි නොවිය යුතුයි ;

(උ) බදුකාරයා විසින් මෙම ඉඩම පදිංචිය පිණිස මිස අන් කවර කටයුත්තක් සඳහාවත් පාවිච්චි නොකළ යුතුයි.

3. මෙහි සඳහන් දින සිට සති හයක් ඇතුළතදී ඉඩම් කැබැල්ල නොදිය යුතු බවට සැහෙන හේතු ලියා මා වෙත ඉදිරිපත් නොකළ හොත් මේ ඉල්ලීම අනුව බද්ද දෙන්නෙමි.

ඊ. කේ. ආර්. අසරප්පා,
ඉඩම් කොමසාරිස් වෙනුවට.

1960 අගෝස්තු 12 වෙනි දින,
කොළඹ.

---

අංකය : ඇල්. ඇස්. 4638.

## 21 (2) වැනි රජයේ ඉඩම් රෙගුලාසිය යටතේ කරන නිවේදනයයි

වව්නියා දිස්ත්‍රික්කයේ, මූහතන්කුලම්හි පිහිටි අක්. 5 ක් පමණ වූ රජයේ ඉඩම් කැබැල්ලක්, පාඨශාලාවක් පිහිටුවීම සඳහා, මූහතන්කුලම් (දෙවැනි පියවරේ) ග්‍රාම සංවර්ධන සමිතියේ භාරකරුවන් වන ඇස්. අය්යම්පිල්ලේ, කේ. නවරත්නම් සහ ඇම්. මරය්සල්පිල්ලේ යන මහතුන් විසින් බදු ඉල්ලා ඇති බව මහජනයා වෙත මෙයින් දනුම් දෙමි. ඉඩමෙහි මායිම් මෙසේය :—

උතුරට: වෙළඳ කටයුතු සඳහා වෙන් කළ ඉඩම; දකුණට: මූහතන්කුලම් (දෙවැනිපියවරේ) බිම් කැබැලි 85 සහ 86; නැගෙනහිරට: මන්නාරම්—මැදවච්චි ප්‍රසිද්ධ පාර; බටහිරට: මූහතන්කුලම් (දෙවැනි පියවරේ) බිම් කැබලි 118, 119 සහ 89.

2. අවශ්‍ය කාරණය සඳහා ඉඩම බදු දීමට පුළුවන. එබැවින් රජයේ සම්මත සෙසු කොන්දේසි වලට අමතර වශයෙන් හා පහත සඳහන් කොන්දේසිවලට ද යටත් කොට ඉඩම බදු දීමට රජය අදහස් කොට තිබේ:—

(අ) කාලය: අවුරුදු 5 යි;

(ඉ) බද්ද: අවුරුද්දකට රු. 3 ශත 75 යි;

(උ) බදු ගන්නන් විසින් බද්ද ආරම්භ වූ දින සිට අවුරුදු 2 ක් ඇතුළත දී වව්නියා දිසාපති තැනගේ සිත් ගන්නා පරිද්දෙන් එකී ඉඩමෙහි පාඨශාලාවක් තනා නිම කළ යුතුය;

(එ) බදු ගන්නන් විසින් මෙම ඉඩම පාඨශාලාවක් තැනීම පිණිස මිස අන්‍ය කටයුත්තක් සඳහා නොයෙදවිය යුතුයි.

3. මෙහි පහත සඳහන් දින සිට සති 6ක් ඇතුළත මෙම ඉඩම බදු නොදිය යුතු බවට පිළිගැනෙන හේතු ලියා මා වෙත ඉදිරිපත් නොකළහොත් ඉල්ලීම අනුව බද්ද දෙනු ලැබේ.

වී. රාමනාදන්,
ඉඩම් කොමසාරිස් වෙනුවට.

1960 අගෝස්තු මස 12 වැනි දින,
කොළඹ දීය.

---

අංකය : ඇල්. ඇස්. 4609.

## 21 (2) වැනි රජයේ ඉඩම් රෙගුලාසිය යටතේ කරන නිවේදනයයි

වව්නියා දිස්ත්‍රික්කයේ සින්නතම්පනෛයි හි පිහිටි අක්කර 5ක් පමණ වූ රජයේ ඉඩම් කැබැල්ලක්, පාඨශාලාවක් පිහිටුවීම සඳහා, සින්නතම්පනෛයි ග්‍රාම සංවර්ධන සමිතියේ භාරකරුවන් වන කනපතිපිල්ලේ කුමාරසිංහම්, කන්දයියා කෝනන්ඩි සහ කර්තිගේසු සින්නදුරෛයි යන මහතුන් විසින් බදු ඉල්ලා ඇති බව මහජනයා වෙත මෙයින් දනුම් දෙමි. ඉඩමෙහි මායිම් මෙසේය :—

උතුරට : සින්නතම්පනෛයි ග්‍රාම සංවර්ධන සමිතියට අයත් ඉඩම : දකුණට : රජයේ ඉඩම ; නැගෙනහිරට : පෙරියපුලිනලන්කුලම—සින්නතම්පනෛයි ගම්සහා පාර ; බටහිරට : රජයේ ඉඩම.

2. අවශ්‍ය කාරණය සඳහා ඉඩම බදු දීමට පුළුවන. එබැවින් රජයේ සම්මත සෙසු කොන්දේසි වලට අමතර වශයෙන් හා පහත සඳහන් කොන්දේසිවලට ද යටත් කොට ඉඩම බදු දීමට රජය අදහස් කොට තිබේ :—

(අ) කාලය : අවුරුදු 5 යි.

(ඉ) බද්ද : අවුරුද්දකට රු. 2 ශත 50 යි.

(උ) බදු ගන්නන් විසින් බද්ද ආරම්භ වූ දින සිට අවුරුදු 2 ක් ඇතුළත දී වව්නියා දිසාපති තැනගේ සිත් ගන්නා පරිද්දෙන් එකී ඉඩමෙහි පාඨශාලාවක් තනා නිම කළ යුතුය.

(එ) බදු ගන්නන් විසින් මෙම ඉඩම පාඨශාලාවක් තැනීම පිණිස මිස අන්‍ය කටයුත්තක් සඳහා නොයෙදවිය යුතුයි.

3. මෙහි පහත සඳහන් දින සිට සති හයක් ඇතුළත දී මෙම ඉඩම බදු නොදිය යුතු බවට පිළිගැණෙන හේතු ලියා මා වෙත ඉදිරිපත් නොකළහොත් ඉල්ලීම් අනුව බද්ද දෙනු ලැබේ.

වී. රාමනාදන්,
ඉඩම කොමසාරිස් වෙනුවට.

1960 අගෝස්තු මස 12 වැනි දින,
කොළඹ දී ය.

අංකය : ඇල්. ඇස්. 4511.

## 21 (2) වැනි රජයේ ඉඩම් රෙගුලාසිය යටතේ කරන නිවේදනයයි

කුරුණෑගල දිස්ත්‍රික්කයේ දේවමැදි හත්පත්තුවේ මැදගම්දහේ කෝරලේ කැලෑගම පිහිටි 2,832 වැනි අවසාන ගම් පිඹුරයේ රූඩ්. 2, පර්. 16 ක ප්‍රමාණයකින් යුත් අංක 100 දරණ බිම් කට්ටිය ගබඩාවක් පිහිටුවීම සඳහා කැලෑගම තිස්ස විවිධසේවා සමූපකාර සමිතිය විසින් බදු ඉල්ලා ඇති බැව් මහජනයා වෙත මෙයින් දනුම් දෙමි.

2. අවශ්‍ය කාරණය සඳහා ඉඩම බදුදීමට පුළුවන. එබැවින් රජයේ සම්මත සෙසු කොන්දේසිවලට අමතර වශයෙන් හා පහත සඳහන් කොන්දේසිවලට ද යටත් කොට ඉඩම බදු දීමට රජය අදහස් කොට තිබේ:—

(අ) කාලය: අවුරුදු 30 යි;

(ඉ) බද්ද: අවුරුද්දකට රු. 1 ශත 25 යි;

(උ) බදුගන්නා විසින් බද්ද ආරම්භ වූ අවුරුදු 1 ක් ඇතුළත දී කුරුණෑගල දිසාපති තැනගේ සිත් ගන්නා පරිද්දෙන් එකී ඉඩමෙහි ගබඩාවක් තනා නිම කළ යුතුයි;

(එ) බදු ගන්නා විසින් මෙම ඉඩම ගබඩාවක් තැනීම පිණිස මිස අන්‍ය කටයුත්තක් සඳහා නොයෙද විය යුතුය.

3. මෙහි පහත සඳහන් දින සිට සති 6ක් ඇතුළත මෙම ඉඩම බදු නොදිය යුතු බවට පිළිගැනෙන හේතු ලියා මා වෙත ඉදිරිපත් නොකළහොත් ඉල්ලීම අනුව බද්ද දෙනු ලැබේ.

වී. රාමනාදන්,
ඉඩම් කොමසාරිස් වෙනුවට.

1960 අගෝස්තු මස 12 වැනි දින,
කොළඹ දීය.

---

අංකය : ඇල්කේ 152.

## ආණ්ඩුවේ ඉඩම් පිළිබඳ 21(2) වැනි රෙගුලාසිය යටතේ කරන නිවේදනයයි

කැකිරාවේ පදිංචි ඇම්. ඇස්. ඇල්. මොහොමඩ් සහ යූ. ඒ. මොහොමඩ් යන මහත්වරු අනුරාධපුර දිස්ත්‍රික්කයේ කැකිරාවේ පිහිටි අංක 908 දරණ අවසාන ගම් පිඹුරයට අයත් 104 ඊ දරණ බිම් කට්ටියෙන් පාර්චස් 7.07ක් පමණ ඇති ආණ්ඩුවේ ඉඩම් කැබැල්ලක් පදිංචිය සහ වෙළඳාම සඳහා දීර්ඝ කාලීන බද්දට ඉල්ලා ඇති බව මෙයින් දැනුම් දෙමි.

2. 1924 සිට දිගටම බලපත්‍ර මත දරන ලද මේ බිම් කැබැල්ලේ දැනට යූ. ඒ. මොහොමඩ් මහතා පදිංචිව සිටී. ඉඩමේ දනට පිළිවෙලින් රු. 1,000ක් සහ රු. 2,000ක් වටිනා (තාවකාලික සහ ස්ථිර) ගොඩනැගිලි දෙකක් ඇත. ගොඩනැගිලි දෙකම වෙළඳ ස්ථාන ලෙස පැවැත්වේ. බලපත්‍රයක් යටතේ භුක්තිය තවදුරටත් නොගැලපෙන නිසා රජයේ සෙසු කොන්දේසි වලට අමතරව පහත සඳහන් කොන්දේසි වලටද යටත්ව ඉල්ලීම ප්‍රකාර ඉඩම බදු දීමට අදහස් කර ඇත :—

(අ) කාලය : අවුරුදු 99යි ;

(ඉ) බද්ද : අවුරුද්දට රු. 28.80යි. මෙම බද්ද අනුරාධපුර දිසාපති තුමා විසින් සෑම අවුරුදු 30 කට වරක් සංශෝධනය කරනු ඇත. එසේ කිරීමේදී සංශෝධිත බද්ද ඊට කලින් අවුරුදු 30 තුළ තිබුන බදු මුදලට වඩා සියේට 50 කට වඩා වැඩි නොවිය යුතුය ;

(උ) බදුකරුවන් විසින් ඉඩම වෙළඳ ස්ථානයකට සහ පදිංචිය සඳහා මිස අන් කටයුත්තකට නොයෙදවිය යුතුය.

3. බද්ද නොදිය යුතු බවට සැහෙන හේතු මෙහි සඳහන් දිනයේ සිට සති 6ක් ඇතුළත දී මා වෙත ලියා ඉදිරිපත් නොකළහොත් ඉල්ලීම අනුව බද්ද දෙනු ලැබේ.

ඊ. කේ. ආර්. අසරප්පා,
ඉඩම් කොමසාරිස් වෙනුවට.

1960 අගෝස්තු 12 වෙනි දින,
කොළඹ.

---

## අනුරාධපුර නව නගරයේ වෙළඳ කටයුතු සඳහා බිම් කොටස් බදු දීම

අනුරාධපුර දිස්ත්‍රික්කයේ දිසාපති තුමා විසින් අනුරාධපුර නව නගරයේ වෙළඳ කටයුතු සඳහා පහත සඳහන් ප්‍රදේශයේ බිම් කොටස් 130ක් බදු දීම සඳහා අයදුම් පත් මෙයින් කැඳවනු ලැබේ:—

**මෙකී වෙළඳ ප්‍රදේශ අංක 1.**

උතුරට : ඩික්සන් පාර ; නැගෙනහිරට : නුවර වැව වැව් බැම්ම ; දකුණට : වාන් ඇල ; බස්නාහිරට : දුම්රිය ස්ථානය සම්මුඛ වීමේ පාර හා ඩික්සන් පාර හමුවන හන්දියෙන් පටන් ගෙන ලංකා බැංකු ගොඩනැගිල්ල දක්වා වැටී ඇති අළුත් පාර.

මෙකී ප්‍රදේශයෙහි අඩි 70×අඩි 15 ප්‍රමාණයෙන් යුතු තට්ටු දෙකේ වෙළඳ ගොඩනැගිලි සෑදිය යුතු ඉඩම් කැබැලි 3ක් තිබේ. එමෙන්ම අඩි 70×අඩි 15 ප්‍රමාණයෙන් යුතු තනි තට්ටුවේ වෙළඳ ගොඩනැගිලි සෑදිය යුතු ඉඩම් කැබැලි 2ක් තිබේ.

**මෙකී වෙළඳ ප්‍රදේශ අංක : 2.**

මෙම ප්‍රදේශය අළුත් ලංකා බැංකු ගොඩනැගිල්ලට නුදුරුව අළුත් පාර දෙපස පිහිටියේ ය. මෙහි අඩි 100 × අඩි 20ක් දිග තට්ටු දෙකේ වෙළඳ ගොඩනැගිල්ලක් සෑදිය යුතු ඉඩම් කැබැලි 1ක් තිබේ.

**මෙකී වෙළඳ ප්‍රදේශ අංක 4.**

උතුරට: පී සහ කිව් යන අකුරුවලින් දැක්වෙන වන්නියන් කුලමට යන පාර ; දකුණට : කොම්බිච්චන් කුලම වැවේ බැම්ම ; නැගෙනහිරට : කොම්බිච්චන් කුලම වැව් බැම්මේ සිට මහ පාරට වැටෙන අඩි 30ක් පළලැති කුඩා පාර ; බටහිරට : දුම්රිය මාවත.

මෙහි අඩි 80×අඩි 20 ප්‍රමාණයෙන් යුතු තට්ටු දෙකේ වෙළඳ ගොඩනැගිලි සෑදිය යුතු ඉඩම් කැබැලි 50ක් තිබේ. එමෙන්ම අඩි 70×අඩි 15 ප්‍රමාණයෙන් යුතු ඉඩම් කැබැලි 74ක් තිබේ. එම 74හි සෑදිය යුත්තේ තනි තට්ටුවේ ගොඩනැගිලිය.

2. මෙකී වෙළඳ කටයුතු සඳහා වෙන්වූ ඉඩම් බදුදීමට සුදුසු අය තෝරීමේදී පහත සඳහන් ප්‍රමුඛත්වය පිළිපදිනු ලැබේ:—

(අ) අනුරාධපුර සංරක්ෂණ ක්‍රමය යටතේ සුරක්ෂිත බිම් ප්‍රදේශයට වෙන් කිරීම සඳහා පැරණි නගරයේ රජයට ගත් වෙළඳාම වෙනුවෙන් යොදවා තිබී බිම් කැබැලි හිමිව හෝ බදුගෙන සිටිය අය හා එකී ප්‍රදේශයේ දැනට කඩ දමා ඇති වෙළඳාමට යෙදුවාවූ ගොඩනැගිලි කුලියට ගෙන සිටි අය ;

(ආ) අනුරාධපුර නව නගරයේ පළමුව කොටසේ තිබෙන නව නගර සංවර්ධනය සඳහා රජයට ගන්නා ලද ඉඩම් හිමිව සිටි අය ;

(ඉ) අනුරාධපුර සංරක්ෂක පෙදෙස වෙනුවෙන් තම ඉඩම් රජයට ලබාගන්නා බවට දන්වා ඇති වෙළඳාමට සුදුසු ඉඩම් හිමියන්, ඒ අය එම ඉඩම් ගන්නා බව දන්වූ දිනට අනන්තර පූර්වයෙන් අඩු වශයෙන් අවුරුදු පහක්වත් අඛණ්ඩව එම ඉඩම් අයිති කරුවන්ව සිටි අය විය යුතුයි;

(ඊ) අනුරාධපුර පැරණි නගරයේ වෙළඳාම සඳහා යෙදුවාවූ ඉඩම් හිමිව සිටි අය, මේ අය ඒවා රජයට ගන්නා බවට දන්වූ දිනට අනන්තර පූර්වයෙන් අඩු වශයෙන් අවුරුදු පහක් වත් එකී ඉඩම් වල අඛණ්ඩව අයිතිකරුවන්ව සිටි අය විය යුතුයි;

(උ) අනුරාධපුර සංරක්ෂිත ක්‍රමය යටතේ සුරක්ෂිත බිම්, බිම් ප්‍රදේශයට වෙන් කිරීම සඳහා පැරණි නගරයෙන් රජයට ගත් වෙළඳාම් පෙදෙස් හැර අන්කිසි ඉඩම් හිමිව හෝ බදු ගෙන එකී ප්‍රදේශයේ දැනට කඩා දමා ඇති යම් ගොඩනැගිල්ලක් කුලියට ගෙන සිටි අය;

(ඌ) අනුරාධපුර සංරක්ෂිත පෙදෙස වෙනුවෙන් තම ඉඩම් රජයට ගන්නා බවට දන්වා ඇති වෙළඳාමට සුදුසු ඉඩම් හැර අන් ඉඩම් හිමියන් ඒ අය ඉඩම් ගන්නා බවට දැන්වූ දිනට අනන්තර පූර්වයෙන් අඩු වශයෙන් අවුරුදු පහක්වත් අඛණ්ඩව මෙම ඉඩම්වල අයිතිකරුවන්ව සිටි අය විය යුතුයි;

(එ) අනුරාධපුර පැරණි නගරයේ වෙළඳාමට සුදුසු ඉඩම් හැර අන් ඉඩම් හිමි අය, මෙම ඉඩම් ගන්නා බවට දැන්වූ දිනට අනන්තර පූර්වයෙන් අඩු වශයෙන් අවුරුදු පහක් තුළ අඛණ්ඩව මෙම ඉඩම් හිමියන්ව සිටි අය විය යුතුයි;

(ඒ) නව නගරය සංවර්ධනය කිරීම් වස් අනුරාධපුර නව නගරයේ පළමුවන හා දෙවන කොටස් වලින් රජයට ලබා ගත් ඉඩම් අයිතිකරුවන්;

(ඔ) අනුරාධපුර සංරක්ෂක පෙදෙස වෙනුවෙන් තම ඉඩම් රජයට ගන්නා බවට දන්වා ඇති නව නගරයේ පළමුවන හා දෙවන කොටස්වල ඉඩම් හිමි අය, ඒ අය මෙම ඉඩම් මෙසේ ලබා ගන්නා බවට දැන්වූ දිනට අනන්තර පූර්වයෙන් අඩු වශයෙන් අවුරුදු 5 ක් තුල අඛණ්ඩව මෙම ඉඩම් අයිති කරුවන්ව සිටිය යුතුයි;

(ඕ) අනුරාධපුර පැරණි නගරයේ ඉඩම් නොමැති එහෙත් ස්ථිර පදිංචියට ස්ථානයක් ඇත්තා වූ අය.

මීට අමතර අයගෙන් එවනු ලබන ඉල්ලුම් පත් ගැන සලකා බලනු යේ මෙකී අයට ඉඩම් දී තවත් ඉතිරිව තිබුනොත් පමණකි.

**සංලක්ෂ්‍යය.**—ඉහත සඳහන් ප්‍රකාර වෙළඳාම් බිමක් හිමිව, බදුගෙන හෝ කුලියට ගෙන සිට එය සංරක්ෂිත පෙදෙස වෙනුවෙන් රජයට ගනුලැබූ හෝ එවැන්නක් රජයට ගන්නා බවට දන්වා ඇති යම් අයෙකුට නවනගරයෙන් වෙළඳාම් ගොඩනැගිල්ලක් දැනටමත් රජයෙන් දී තිබේ නම් ඔහු මීට සුදුස්සෙක් වනුයේ මෙම ඉඩම ලැබූ විට එහි ගොඩනැගිලි සෑදූ වහාම යථෝක්ත රජයේ ගොඩනැගිලි අත් හැරීමට පොරොන්දුවන්නේ නම් පමණකි.

3. මෙම ඉල්ලුම්පත් එවනවිට "දිසාපති තුමා, අනුරාධපුරය" යනුයා එවිය යුතුයි. තවද මෙම ඉල්ලුම් පත් වර්ෂ 1960 අගෝස්තු 30 වන දින උදය 10 ට පෙර හෝ ඊට පෙර එතුමාට ලැබෙන්නට සැලැස්විය යුතුයි. සෑම ඉල්ලුම් පතකම පහත සඳහන් විස්තර අඩංගුවිය යුතුයි. එකී විස්තර :—

(අ) රජයට ගනුලැබූ හෝ ගැනීමට අදහස් කරන ඉල්ලුම් කරු සතුවූ හෝ පදිංචිවූ වෙළඳාම් සඳහා යෙදුවාවූ ඉඩම් වල හෝ අන් ඉඩම්වල විස්තර,

(ආ) ඉල්ලුම් කරු බදුගැනීමට අදහස් කරණ ඉඩමේ ප්‍රමාණය.

4. තෝරාගනුලැබූ සෑම ඉල්ලුම් කරුවකුම වෙනත් කරුණු වලට අමතරව පහත සඳහන් කොන්දේසි වලට යටත් බද්දකට ඇතුලත් වීමට අවශ්‍යවේ :—

(අ) බද්ද දෙනු ලබන්නේ අවුරුදු 99 කටයි.

(ආ) බදුකරු ඉඩම වෙනුවෙන් එහි මූඩුබිමේ වටිනාකමෙන් සියයට හතර ගණනේ ගණන් බැලූ වාර්ෂික බදුමුදලක් ගෙවිය යුතුයි.

(ඉ) බදුකරු වර්ෂ දෙකක් ඇතුලතදී තමාගේ වියදමින් රජයේ නගර නිර්මාණ ශිල්පියා විසින් පළමුව අනුමත කරණ ලද සැලැස්මක් අනුව මෙම ඉඩමේ ගොඩනැගිල්ලක් සදා නිම කළ යුතුයි.

(ඊ) බදුකරු බද්ද ගත් දින සිට අවුරුද්දක් ඇතුලතදී ගොඩ නැගිල්ල සෑදීමට පටන් ගත යුතුයි.

(උ) බදුකරු ඉඩම වෙළඳාම සඳහා හැර අන් කිසි කටයුත්තක් සඳහා නොයෙදිය යුතුයි.

5. බදුකරුවන් තෝරීමේ ඉඩම් කච්චේරිය වර්ෂ 1960 සැප්තැම්බර් 2 වන දින උදය 10.00 ට අනුරාධපුර නව නගරයේ ජයන්ති මාවතේ පිහිටි තොරතුරු විමසීමේ කාර්යාලයේදී පවත්වනු ලැබේ. සෑම ඉල්ලුම් කරුවකුම තමා හෝ තමා විසින් ලියවිල්ලකින් බලය පවරන ලද කෙනෙක් හෝ මෙකී ඉඩම් කච්චේරියේදී පෙනී සිටිය යුතුයි.

6. ඉඩම් පිහිටි ස්ථාන හා මේ පිළිබඳ වෙනත් විස්තර අනුරාධපුර දිසාපති තුමාගෙන් දැනගත හැක.

ඇන්. පී. විජයරත්න,
අනුරාධපුර දිසාපති තුමා.

අනුරාධපුර දිසාපති කාර්යාලයේදීය,
1960 අගෝස්තු 1 දින.

---

අංකය : ඇල්. ඇස් 4614

## 21 (2) වැනි රජයේ ඉඩම් රෙගුලාසිය යටතේ කරන නිවේදනයයි

පොළොන්නරුව දිස්ත්‍රික්කයේ තමන්කඩුව ප්‍රාදේශීය ආදායම් නිලධාරි කොට්ඨාශයේ පිහිටි ඇෆ්. වී. පී. 10 වැනි පිඹුරයේ 95 වැනි බිම් කැබැල්ලෙන් අක්. 1 පමණ වූ රජයේ ඉඩම් කැබැල්ලක් කායශාලයක් හා ගබඩාවක් පිහිටුවීම සඳහා, ගල්ඔය හන්දියේ විවිධ සේවා සමුපකාර සමිතිය විසින් බදු ඉල්ලා ඇති බැව් මහජනයා වෙත මෙයින් දනුම් දෙමි. ඉඩමෙහි මායිම් මෙසේය :—

උතුරට : ඞී. දයාපාල මහත්මයාගේ ඉඩම; දකුණට : ප්‍රසිද්ධ පාරට වෙන් කරන ලද රක්ෂිත ඉඩම; නැගෙනහිරට : ප්‍රසිද්ධ පාරට වෙන් කරන ලද රක්ෂිත ඉඩම; බටහිරට : ඇළ සඳහා වෙන් කරන ලද රක්ෂිත ඉඩම

2. අවශ්‍ය කාරණය සඳහා ඉඩම බදු දීමට පුළුවන. එබැවින් රජයේ සම්මත සෙසු කොන්දේසි වලට අමතර වශයෙන් හා පහත සඳහන් කොන්දේසිවලට ද යටත් කොට ඉඩම බදු දීමට රජය අදහස් කොට තිබේ :—

(අ) කාලය : අවුරුදු 30 යි.

(ඉ) බද්ද : අවුරුද්දකට රු. 2 යි.

(උ) බදු ගන්නා විසින් බද්ද ආරම්භ වූ අවුරුදු 1 ක් ඇතුළත දී පොළොන්නරුවේ සමුපකාර සංවර්ධන සහකාර කොමසාරිස් විසින් කලින් අනුමත කරනු ලැබූ සැලසුම් අනුව මෙම ඉඩමෙහි කායශාලයකට හා ගබඩාවකට අවශ්‍ය ගොඩනැගිලි තනා නිම කළ යුතුයි.

(එ) බදු ගන්නා විසින් මෙම ඉඩම කායශාලයක් හා ගබඩාවක් තැනීම පිණිස මිස අන්‍ය කටයුත්තක් සඳහා නොයෙදවිය යුතුය.

3. මෙහි පහත සඳහන් දින සිට සති හයක් ඇතුළත දී මෙම ඉඩම බදු නොදිය යුතු බවට පිළිගැණෙන හේතු ලියා මා වෙත ඉදිරිපත් නොකළහොත් ඉල්ලීම අනුව බද්ද දෙනු ලැබේ.

වී. රාමනාදන්,
ඉඩම් කොමසාරිස් වෙනුවට.

1960 අගෝස්තු මස 12 වැනි දින,
කොළඹ දී ය.

---

අල්. ඇස්. 4635.

## 21 (2) වැනි රජයේ ඉඩම් රෙගුලාසිය යටතේ කරන නිවේදනයයි

පොළොන්නරුව දිස්ත්‍රික්කයේ තමන්කඩුව ප්‍රාදේශීය ආදායම් නිලධාරි කොට්ඨාශයේ ලක්ෂඋයන හි පිහිටි පරාක්‍රම සමුද්‍ර ව්‍යාපාරයේ බී. ඕ. පී. 305 වැනි පිඹුරයෙන් අක්. 2 ක් පමණ වූ රජයේ ඉඩම් කැබැල්ලක් කායශාලයක් හා ගබඩා පිහිටුවීම සඳහා, ලක්ෂඋයන-පැරකුම් උයන විවිධසේවා සමුපකාර සමිතිය විසින් බදු ඉල්ලා ඇති බැව් මහජනයා වෙත මෙයින් දනුම් දෙමි. ඉඩමෙහි මායිම් මෙසේය:—

උතුරට : පාර සහ අනාගත වැඩිදියුණු කිරීම් සඳහා වෙන්වූ ආණ්ඩුවේ ඉඩම; දකුණට : ආර්. බී. 2 ඇලේ වෙන් කරන ලද ඉඩම්; නැගෙනහිරට : ආණ්ඩුවේ ඉඩම්; බටහිරට : ඞී. 1 උතුරු ඇලේ රක්ෂිත ඉඩම්.

2. අවශ්‍ය කාරණය සඳහා ඉඩම බදු දීමට පුළුවන. එබැවින් රජයේ සම්මත සෙසු කොන්දේසි වලට අමතර වශයෙන් හා පහත සඳහන් කොන්දේසිවලට ද යටත් කොට ඉඩම බදු දීමට රජය අදහස් කොට තිබේ :—

(අ) කාලය : අවුරුදු 30 යි.

(ඉ) බද්ද : අවුරුද්දකට රු. 20 යි.

(උ) බදුගන්නා විසින් බද්ද ආරම්භ වූ අවුරුදු 1ක් ඇතුළත දී පොළොන්නරුවේ සමුපකාර සංවර්ධන සහකාර කොමසාරිස් විසින් කලින් අනුමත කරනු ලැබූ සැලසුම් අනුව මෙම ඉඩමෙහි කායශාලයකට හා ගබඩාවලට අවශ්‍ය ගොඩනැගිලි තනා නිම කළ යුතුයි.

(එ) බදු ගන්නා විසින් මෙම ඉඩම කායශාලයක් හා ගබඩා තැනීම පිණිස මිස අන්‍ය කටයුත්තක් සඳහා නොයෙදවිය යුතුය.

3. මෙහි පහත සඳහන් දින සිට සති හයක් ඇතුළත දී මෙම ඉඩම බදු නොදිය යුතු බවට පිළිගැණෙන හේතු ලියා මා වෙත ඉදිරිපත් නොකළහොත් ඉල්ලීම් අනුව බද්ද දෙනු ලැබේ.

වී. රාමනාදන්,
ඉඩම් කොමසාරිස් වෙනුවට.

1960 අගෝස්තු මස 12 වැනි දින,
කොළඹ දී ය.

ලංකාණ්ඩුවේ මුද්‍රණාලයේ මුද්‍රණය කරන ලදී.